සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 8 – Second Term Test – July 2019

දෙවන වාර පරීක්ෂණය - 2019 ජුලි - 8 ශ්‍රේණිය

කාලය : පැය 2
Time : 2 hours

## Islam
## ඉස්ලාම්

Name :- .................................................... Grade : -................ Index number:-....................

### I කොටස

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.**

1. ''සබබ්'' යනු,
   (i) අණ දීම (ii) අනුමානය (iii) නීතිරීති (iv) පුස්කොළපොත්

2. අල් කුර්ආනය, මුඃජිසාත් ලෙස හිමි වූ නබිවරයා,
   (i) මුහම්මද් නබිතුමා (ii) මූසා නබිතුමා
   (iii) දාවුද් නබිතුමා (iv) ඊසා නබිතුමා

3. ගල්වැසි මගින් විනාශ කරනු ලැබූ සමාජය,
   (i) නබිලූත් (අලෛ) තුමාගේ සමාජය (ii) සාලිහ් (අලෛ) තුමාගේ සමාජය
   (iii) ආද් සමාජය (iv) ඉස්රායිල් සමාජය

4. ස්වර්ගයේ යතුර ලෙස හඳුන්වන්නේ,
   (i) උපවාසය (ii) යහ ගුණාංග (iii) සලාතය (iv) zසකාත්

5. රාත්‍රිබත් වූ සුන්නත් සලාතයක් නොවන්නේ,
   (i) තහජ්ජත් සලාතය (ii) විත්ර් සලාතය
   (iii) උත්සව සලාතය (iv) ලුහා සලාතය

6. පරලොව දී මුඃමින් වරයකුගේ තරාදියේ බර අධික කරවන්නේ,
   (i) සලාතය (ii) යහගුණාංග
   (iii) උපවාසය (iv) සම්පත්

7. ''යතීම්'' යනු,
   (i) දුගීන්ගේ භාරකරු
   (ii) අනාථයින්
   (iii) හජ් සඳහා වන්දනාකරුවන් රැගෙන යන්නන්
   (iv) zසකාත් ලැබීමට සුදුසුකම් ඇති අය

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

8. මතු දිනයක අල්ලාහ් පිළිගන්නන් හට බොහෝ දුක් කරදර කිරීමට නියමිතව සිටින තැනැත්තා,
   (i) දජ්ජාල් (ii) නුම්රූද් (iii) ෆිර්අවුන් (iv) අබූ ලහබ්

9. සූරා මාඌන් හි ඇතුළත් ආයත් සංඛ්‍යාව,
   (i) 3 (ii) 4 (iii) 5 (iv) 7

10. අල්ලාහ් ස්තුති කිරීම සඳහා කරනු ලබන සුන්නත් වූ සජ්දාව,
   (i) සජ්දා සහ්වු (ii) සජ්දා තිලාවත්
   (iii) සජ්දා ෂුක්ර් (iv) සජ්දා සුන්නත්

➢ **යා කරන්න.**

| | | | |
|---|---|---|---|
| 11. | පරලොව දී කන්නලව් කරයි | • | කලිමා |
| 12. | අල්ප වස්තූන් | • | දුආ |
| 13. | නියෝජිතයා | • | ෆර්ලු අයින් |
| 14. | ප්‍රාර්ථනා කිරීම | • | අල් කුර්ආන් |
| 15. | ජුමාආ සලාතය | • | මාඌන් |

➢ **හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ ලියන්න.**

16. මූසා (අලෛ) තුමාට අල්ලාහ් ආගම් සහ සුහුෆ් යන දෙකම පහළ කළේය. (    )

17. ග්‍රහණ සලාතයට සලාතුල් කුසුෆෙයින් යයි කියනු ලැබේ. (    )

18. ''සදකා'' ෆර්ලු වූ ඉබාදතයකි. (    )

19. සජ්දා සහ්වු සඳහා සුජූද් දෙකක් ඇත. (    )

20. ගමනක දී පමණක් සලාතය කෙටි කළ නොහැකිය. (    )

(2 × 20 = 40)

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය ඇතුලුව ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.**

1. (i) අර් රහ්මාන්, අර් - රහීම් යන වචනවල අර්ථය ලියන්න.
   (ii) උලුල් අස්මි වන නබිවරු දෙදෙනෙක් නම් කරන්න.
   (iii) සලාතයේ දී පාරායනය කරන ෆර්ලු වූ පාරායනා දෙකක් ලියන්න.
   (iv) එක් සුජුදයක් පමණක් කළ යුතු සුන්නත් වූ සජදා දෙකක් ලියන්න.
   (v) zසකාත් හා සදකා දෙක අතර ඇති වෙනස්කම් දෙකක් වගුගත කරන්න.
   (vi) කලීලුල්ලාහ්, කලීමුල්ලාහ් යන විශේෂ නම් ලැබූ නබිවරුන්ගේ නම් පිළිවෙළින් ලියන්න.
   (vii) ජමාඅත් වශයෙන් කළ යුතු ෆර්ලු සලාත් දෙකක් නම් කරන්න.
   (viii) ෆර්ලු වූ සලාතයේ වර්ග දෙක කුමක්ද?
   (ix) අල් කුර්ආනයේ සලාතය සමග එක් කොට පවසන අනෙක් ඉබාදතය කුමක්ද?
   (x) සලාතුල් ඊතයින් යනු කුමක්ද?

(2 × 10 = 20)

2. (i) අතිශයින් සමා කරන්නා අතිශයින්ම පව් සමාව ගන්නා යන්නෙහි ආරබි වචන දෙක නම් කරන්න.
   (ii) ''අල් කුර්ආනය අවසාන ආගම වේ'' යන්නට හේතු සාධක දෙකක් ලියන්න.
   (iii) zසකාත් ලැබීමට සුදුසුකම් ඇති පුද්ගල කාණ්ඩ 5ක් නම් කරන්න.

3. (i) කුනුත් පාරායනය කළ යුතු අවස්ථා දෙකක් ලියන්න.
   (ii) ජමාඅත් වශයෙන් කළ යුතු සුන්නත් වූ සලාත් තුනක් නම් කරන්න.
   (iii) සුජුද් දෙකක් අතර ඇති මැද ඉඳුමේ දී කරන පාරායනය ලියන්න.

4. (i) නබි (සල්) තුමාණන්ට කුඩා කාලයේ දීම අමතනු ලැබූ අල් අමීන්, අස් සාදික් යන පද වල අර්ථය ලියන්න.
   (ii) දුආ ප්‍රර්ථනා කිරීම සඳහා ඉතා හොඳ අවස්ථා තුනක් ලියන්න.
   (iii) මහා පාප කර්ම පහක් නම් කරන්න.

5. (i) වහී හි වර්ග දෙක සඳහන් කරන්න.
   (ii) සුරා මාඋන් මගින් අපට ලැබෙන ආදර්ශ තුනක් ලියන්න.
   (iii) ගමන් බිමන් යාමේදී පිළිපැදිය යුතු විනය නීති පහක් ලියන්න.

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

6. (i) අල් කුර්ආන් අන්තර්ගතයට අයත් මාතෘකා දෙකක් ලියන්න.

(ii) පහත නබි වරුන්ට ලබා දුන් හාස්කම් සඳහන් කරන්න.

- සුලෙයිමාන් (අලෛ) තුමා
- ඊසා (අලෛ) තුමා
- දාවුද් (අලෛ) තුමා

(iii) හතරවන හා පස්වන කලීමාව සිංහලෙන් ලියන්න. (2 + 3 + 5 = 10 × 4)